# මහමෙව්නාවෙන් සිදු වූ මහඟු සේවයට දසවසරක් සපිරෙයි



පූජ්‍ය කිරිබත්ගොඩ ඥාණානන්ද ස්වාමීන් වහන්සේ

මහමෙව්නා අසපු සංචිතයේ නිර්මාතෘ පරම පූජනීය කිරිබත්ගොඩ ඥාණානන්ද ස්වාමීන් වහන්සේ විසින් ලෝක වාසී බෞද්ධ ජනතාවට කරන ලද මහඟු සේවයෙන් අල්ප මාත්‍රයක් හෝ ඉතා කෙටියෙන් සඳහන් කළ යුතු අවස්ථාව උදා වී ඇත. එයට ප්‍රධාන හේතුව වන්නේ මෙම වසරේදී මහමෙව්නා භාවනා අසපු සංචිතයෙහි 40 කට අධික ශාඛා ප්‍රමාණයක් සිරිලක පුරා මෙන්ම එංගලන්තය, අමෙරිකා එක්සත් ජනපදය, කැනඩාව, ජර්මනිය, ඉන්දියාව, ඕස්ට්‍රේලියාව ඇතුළු ලොව පුරා රටවල් ගණනාවක පිහිටුවා ලෝකවාසී බෞද්ධ ජනතාව වෙනුවෙන් අති පූජ්‍ය කිරිබත්ගොඩ ඥාණානන්ද ස්වාමීන් වහන්සේ විසින් කරනු ලබන්නාවූ මහඟු සදහම් සේවයට දස වසරක් සම්පූර්ණ වීමයි.

මෙම මහඟු සේවය සමරනු වස් උන්වහන්සේ විසින් සරල සිංහල බසින් ලියන ලද අප ශාස්තෘ ගෞතම සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය ඇතුළත් ග්‍රන්ථ දහසකට අධික ප්‍රමාණයක් මෙල්බර්න් වාසී ඔබ සැමට මිලදී ගැනීමට වටිනා අවස්ථාවක් උදා කර ඇත.

අනාගාමික සමස්ත පවුලක් තිසරණයේ පිහිටුවා සද්ධර්මයට යොමු කරවමින් මෙලොවට බිහි වූ අති පූජ්‍ය කිරිබත්ගොඩ ඥාණානන්ද සමිඳුන් අද ලක්‍ෂ සංඛ්‍යාත ජනතාවකගේ දහම් පිපාසාව සංසිඳවමින් මුලු සිරිලකටම නිර්මල සදහම් අවබෝධය ලබා දෙයි. උන්වහන්සේ දැනටමත් තමන් වහන්සේ ඇරඹූ සරල සිංහල බසින් සූත්‍ර දේශනා කිරීම තව දුරටත් ව්‍යාප්ත කරමින් සුවහසක් බෞද්ධ ජනතාවකගේ සසර මග කෙටි කර ගැනීම සඳහා 400 කට අධික ධර්මධර, විනයධර සුපේශල ආර්ය ශ්‍රාවක සඟරුවනක් බුදු සසුනට දායාද කර ඇත.

අද පන්සල වෙත ඇදෙන ජනතාවට උදය වරුවට එක් සූත්‍ර දේශනාවක්ද සවස් වරුවට තවත් සූත්‍ර දේශනාවක්ද සරල සුගම සිංහල බසින් අසන්නට ලැබීමට පරම පූජනීය කිරිබත්ගොඩ ඥාණානන්ද ස්වාමීන් වහන්සේ විසින් ත්‍රිපිටක ධර්මය සරල බසින් සිංහලට නැංවීමෙන් කරන ලද මහඟු සේවය මහෝපකාරී වන බව නිසැකය.

පුර පසළොස්වක පොහොය දිනයන්හි ත්‍රෛනිකායික - නිකාය තුනටම අයත්- ලක්දිව පුරා විවිධ ගම්මානයන්හි පිහිටා ඇති විහාරස්ථාන 200 කට අධික ප්‍රමාණයක නායක ස්වාමීන් වහන්සේලාගේ ආරාධනය අනුව මහමෙව්නා සංචිතයන්ගෙන් ස්වාමීන් වහන්සේලා දිවයිනේ නොයෙකුත් ප්‍රදේශයන්හි ඇති විහාරස්ථානවලට වැඩම කර ධර්ම දේශනා පවත්වති. ගමේ පන්සලේ දායකයින් විශාල වශයෙන් පන්සල් වෙත ඇදීමටත්, වේගයෙන් පන්සලෙන් ඉවත් වන තරුණ පිරිසට ධර්මය අවබෝධකර දෙමින් නැවත පන්සල් වෙත යොමු කරවීමටත්, ගමේ පන්සලේ දායකයින් තුළ ආගමික ප්‍රබෝධය ඇති කිරීමටත් මෙම දහම් වැඩ සටහන් සමත් වී ඇත. කිසිම ලාභ සත්කාර අපේක්‍ෂාවක් නොමැතිව මහමෙව්නා භාවනා අසපු සංචිතය විසින් ලක්දිව පුරා ඇති ගම්මානයන්හි විහාරස්ථාන වල කරනු ලබන මෙම සදහම් සේවය නිර්මල බුදු දහමේ උන්නතිය පතන්නාවූ සියලුම බොදු බැතිමතුන් අගය කරනු ඇත.

අති පූජනීය කිරිබත්ගොඩ ඥාණානන්ද හිමියන්ගේ සදහම් ශ්‍රවණය කළ සිය ගණනක් තරුණ දරුවන් උත්තරීතර චීවරය දරමින් පැවිදි බිමට ඇතුළත් වීමට උන්වහන්සේ වෙත නිරන්තරයෙන් ඇදෙන්නේ හුදෙක් නිර්මල ශ්‍රී සද්ධර්මය ශ්‍රවණය කිරීමෙන් ඔවුන් තුළ ඇතිවන ප්‍රබෝධය නිසාම බව අමුතුවෙන් කිව යුතු නොවේ. මහමෙව්නා අසපු වෙත මහත් සැදැහැයෙන් පැමිණෙන එම තරුණ දරුවන් හට වසරක කාලයක් අසපු පරිසරයේ සිටිමින් තමා ගත් තීරණය පිළිබඳව හොඳින් සිතා බලන්නටත් ඒ සඳහා පුරුදු පුහුණු වීමට කල් දීමෙන් පසු ශාසනික සම්ප්‍රදායට සියලු ආකාරයෙන්ම අනුකූලව පැවිදි බිමට ඇතුළත් වීමට ඔවුන් හට අවස්ථාව ලැබේ.

සෑම සියලු දෙනාටම පින් රැස් කිරීමට අවස්ථාවක් ලබා දෙන්නාවූ මහමෙව්නා පුණ්‍ය භූමියෙන් සිදුවන සේවය කියා නිම කළ නොහැකිය. බුද්ධ පුත්‍රයන් වහන්සේලා සසුනට දායාද කළ දෙමාපියන් හට අවශ්‍ය දෑ පිළිබඳව සොයා බලා කටයුතු කිරීම අති පූජනීය කිරිබත්ගොඩ ඥාණානන්ද හිමියන්ගේ අනුශාසනය අනුව මහමෙව්නා අසපු සංචිතයෙන් සිදු වන විශේෂ සේවයකි. පැවිදි බිමට ඇතුළත් වූ බුද්ධ පුත්‍රයන් වහන්සේලාගේ දෙමාපියන් හට අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට මෙන්ම එම දෙමාපියන්ගේ යහපත සඳහා අවශ්‍ය අනෙකුත් දෑ පිළිබඳව සොයා බලා කටයුතු කිරීමද පූජනීය කිරිබත්ගොඩ ඥාණානන්ද ස්වාමීන් වහන්සේ සිය දායක දායිකාවන් හරහා කරනු ලබන්නාවූ අති විශාල මෙහෙයකි. ගල්දූව ආරණ්‍ය සේනාසනයේ වැඩ වසන ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා 15 නමක-ගේ දෙමාපියන් වසන්නාවූ ගෙවල් 15 ක්ම ප්‍රතිසංස්කරණය කර දීම උන්වහන්සේ කරනු ලබන්නාවූ බුදු පුත් මා පිය උපහාර වැඩ පිළිවෙල විදහා දක්වන ඉතා සුලු නිදසුනක් පමණි.

ලංකාවේ පමණක් නොව විදෙස් රටවලද ඇති බොහෝ විහාරස්ථානයන්හි වෙසෙන ස්වාමීන් වහන්සේලා සමගින් වන්දනා පිණිස ඉන්දියාවට යන ලක්‍ෂ සංඛ්‍යාත පිරිසකගෙ යහපත සඳහා දඹදිව් තලයේ බුද්ධ ගයාව ආශ්‍රිතව ආරාම පන්සල් විශාල සංඛ්‍යාවක ගොඩනැගිලි සහ ධර්ම ශාලා ඉදිකිරීමට, නවාතැන් පහසුකම් සහ ජල පහසුකම් බැතිමතුන් හට ලබා දීමට, එම ස්ථාන සංවර්ධනය කරමින් ඉතා සත් භාවයෙන් යුතුව උන්වහන්සේ මූලික වී කටයුතු කර ඇත.

පරම පූජනීය කිරිබත්ගොඩ ඥාණානන්ද ස්වාමීන් වහන්සේ විසින් සරල සිංහල බසට පෙරළන ලද ත්‍රිපිටක ග්‍රන්ථ රාශිය මෙන්ම සිය ගණනකට අධික සූත්‍ර දේශනා ඇතුළත් පොත් සංඛ්‍යාව දෙස බලන විට ජාතියේ පිනට පහළ වූ මේ උතුම් සංඝ රත්නය වෙත අප පිදිය යුතු උසස්ම උපහාරය වන්නේ එම ධර්මය අවබෝධ කරගනිමින් මේ ගෞතම බුදු සසුන තුළම සසර දුකින් එතෙරවීමට උත්සාහ කිරීම නොවන්නේදැයි සිතේ.

එම උතුම් ධර්ම ග්‍රන්ථ සියල්ලක්ම පාහේ එකම ස්ථානයකින් ඉතා පහසුවෙන් මිලදී ගැනීමට මෙල්බර්න් පුරවරයේ වසන ඔබ සැමට ලත් මේ උතුම් අවස්ථාව මග නොහරින්න. දෙසැම්බර් මස 26 වන දින සහ 27 වන දිනයන්හි උදේ 9:00 සිට සවස 5:00 දක්වා සිඩ්නි මහමෙව්නා අසපුවාසී පූජ්‍ය යටිබේරියේ ඥාණසෝම ස්වාමීන් වහන්සේ විසින් පවත්වනු ලබන ධර්ම දේශනාවන් සහිතව පැවැත්වෙන දහම් වැඩ සටහන් වලට සහභාගී වන අතරම දහම් පොත්ද මිලදී ගැනීමේ භාග්‍යයද උදා කර ගන්න.

මෙදින ඔබට අති පූජ්‍ය කිරිබත්ගොඩ ස්වාමීන් වහන්සේ විසින් සරල සිංහල බසින් ලියැවුණු සූත්‍ර දේශනා ඇතුළත් සදහම් පොත් දහසකට ආසන්න ප්‍රමාණයක්, සදහම් සූත්‍ර දේශනා ඇතුළත් සීඩී තැටි සහ වීඩියෝ තැටි, ඔබේ දරුවන් සඳහා ලියැවුණු සදහම් පොත් විශාල ප්‍රමාණයක්ද ලබා ගත හැකියි.

එදිනට පැමිණෙන සියලුම බැතිමතුන් සඳහා තේ පැන් සංග්‍රහයක්ද පිරිනැමේ.

විස්තර සඳහා අමතන්න:

සුනන්දා තිලකරත්න -8772 5237 හෝ 0412 517 843

සරත් වික්‍රමසිංහ - 0425767157 හෝ 9308 1623

අති පූජ්‍ය කිරිබත්ගොඩ ස්වාමීන් වහන්සේ විසින් සරල සිංහල බසින් ලියැවුණු සූත්‍ර දේශනා ඇතුළත් පොත් දහසකට ආසන්න ප්‍රමාණයක්, සදහම් සූත්‍ර දේශනා ඇතුළත් සීඩී තැටි සහ වීඩියෝ තැටි, ඔබේ දරුවන් සඳහා ලියැවුණු සදහම් පොත් විශාල ප්‍රමාණයක්ද ලබා ගැනීමට මෙල්බර්න් නුවර වසන ඔබට දැන් අවස්ථාවක් උදා වී ඇත.

# දන්නෝ දනිති

මෙල්බන් සිංහල ගුවන් විදුලිය ගැන ඔක්තෝබර් සන්නසට ඩී බී කුරුප්පු මහතා ලියා තිබූ අදහස් දැක්වීමට උරණ වූ සුරන්ජිත් අතුකෝරළ නම් අයෙකු නොවැම්බර් සන්නසට ලියා තිබූ ලිපිය අප විමතියට පත්කරයි. අතුකෝරළ මහතා උන් හිටි ගමන් නින්දෙන් අවදි වුණා සේ ගුවන් විදුලි කණ්ඩායම වෙනුවෙන් කඩේ යන්නට සැරසුණත් ගුවන් විදුලියට අද අත්ව ඇති ඉරණම අසන්නන්ට නම් රහසක් නොවේ.

වරදක් ඇත්නම් නිවැරදි කරගන්නට උත්සාහ කරනවා විනා වරද පෙන්වා දුන් තැනැත්තාගේ දිග පළල සොයන්නට යාම නූගතුන්ගේ ගතියයි. අද ගුවන් විදුලිය තුළින් දකින්නට ලැබෙන්නේද මේ නොපැසුණ බවමයි. කළ යුතුව තිබුණේ කුරුප්පු මහතාට අපහාස කරමින් ආඩපාලි කිම නොවේ. ඔහු පෙන්වා දුන් වැරදි සාදාගන්නට හැකියාවක් තිබේදැයි කල්පනා කර බැලීමයි.

මේ සිදුව ඇති නාය යාම කාරියකරවන ඇත්තන්ට නොපෙනුනත් පිටත සිට බලා සිටින අපට නම් හොඳින් පෙනෙයි. මේ සඳහා කාරණා කීපයක් පමණක් ඉදිරිපත් කිරීම සෑහේ.

- නිවේදකයන් ගේ අතිශය දුර්වල ඉදිරිපත් කිරීමේ විලාසය
- සම්මුඛ සාකච්ඡා වලදී නිවේදකයන් අසන නොගැඹුරු නොපැසුණ මන්දබුද්ධික ප්‍රශ්න සහ සාකච්ඡා කරනු ලබන විෂයයන් පිළිබඳ ඇති අඩු දැනුම
- වැඩසටහන් තුළින් කැපී පෙනෙන මාධ්‍ය පිළිබඳ නොවැටහීම සහ අඩු බුද්ධිමත් බව
- අසන්නන් ප්‍රිය කළ වැඩසටහන් රැසක් එකින් එක හැලී යාම
- අසන්නන් ගුවන් විදුලියෙන් ඈත්ව යාම

බුද්ධිමත් අසන්නන් සීඝ්‍රයෙන් ගුවන් විදුලියෙන් ඈත්ව යමින් තිබෙද්දී කාරියකරවන ඇත්තෝ ස්වයං තෘප්තියක පැටලී සුබ සිහින දකිමින් සිටිති. ගොඩ පෙරකදෝරුවෝ වගකිවයුත්තන්ට වරද නිවැරදි කරගන්නට උදව් කරනවා වෙනුවට ඒ වරදේම ගැලෙන්ට උපදෙස් දෙමින් ව්‍යාජ නම් වලින් ලිපි ලියමින් සිටිති. අසන්නෝ හූල්ලමින් බලා සිටිති.

අජිත් රුවන්පතිරණ
aruwanpathirana@gmail.com

DIAMOND
MORTGAGE SERVICES
Best in the West
RESIDENTIAL
COMMERCIAL
BUSINESS
Accredited with more than 32 lenders
Home Loans & Refinancing
Low Doc Loans for self employed
Commercial Loans / Franchise Business Loans
Business/Car/Taxi Plate Loans
Personal Loans
Owner Builder Construction Loans
Short-term Loans for student visa matters &
Much, Much More.....
saamArt
PLAN
MFAA
Contact: Nilanthi Jayasinghe
21, Toledo Crescent, Point Cook VIC 3030
Tel: 0404 852 405 Fax: 03 9394 8812
Email: diamondfinance@optusnet.com.au

STANHOPE PRINTING
FOR OFFSET AND DIGITAL PRINTING
සිඩ්නි සහ මෙල්බර්න් ශ්‍රී ලාංකිකයනට කදිම අවස්ථාවක්
- Labels
- School Magazines
- News Letters
- Business Stationery
- Annual Reports
- Special Publications
- Posteres
- Brochures
- Greeting Cards
- Business Cards
- Flyers
- Price Lists
ALL YOUR PRINTING NEEDS....
ඔබගේ සියලුම මුද්‍රණ කටයුතු සඳහා පහත සඳහන් අංකයනට අමතන්න
මුද්‍රණ ඇනවුම් සඳහා තැපැල් ගාස්තුවලට අයකිරීමක් නොමැත
LAKSHMAN
TEL.(02) 9626 7660
MOB.0405287243